## ශ්‍රී ලංකාවේ රාජ්‍යකරණය පිළිබඳ සිවිල් සමාජ විශ්ලේෂණ වාර්තාවේ මූලික කරුණු කෙටියෙන්..

- තාවකාලික විසඳුම් වලින් ඔබ්බට ගොස් අපේ රටේ සැබෑ ක්‍රම වෙනසක් (system change) සඳහා අවශ්‍ය වන දූෂණ විරෝධී සහ රාජ්‍යකරණයේ සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවකි.
- ගැඹුරු අධ්‍යයනයකින් පසුව ඉදිරිපත් කළ මෙම වාර්තාව තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුධයට හේතු වූ කරුණු හඳුනාගෙන, රටේ පාලනය නිවැරදි දිශානතියකට යොමු කිරීමට අවශ්‍ය වන ප්‍රධාන නිර්දේශ 34ක් ඉදිරිපත් කර ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට සිවිල් සමාජයේ මැදිහත් වීමෙන් සකස් කළ මෙම විශ්ලේෂණ වාර්තාවෙන් රට තුල දූෂණ ක්‍රියා මැඩපැවැත්වීමට මූලිකව ආමන්ත්‍රණය කළ යුතු කරුණු හඳුනා ගෙන ඇත.
- ආර්ථිකය යළි ගොඩනැගීමේ ප්‍රයත්නය සාර්ථක වනු දැකීමට නම් මෙම ප්‍රතිසංස්කරණ අත්‍යාවශ්‍ය වන බව මෙම වාර්තාව විග්‍රහ කරයි.

මෙම නිර්දේශ ක්‍රියාත්මක කර ගැනීම සඳහා රජයට බලපෑම් කිරීමට සියලු පුරවැසියන්ගේ සහය ඉතා වැදගත් වේ.

**ක්ෂණිකව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ (මාස 6 තුළ)**

### පවත්නා ක්‍රමවේදයන්හි විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීමේ පියවර

1. බදු නිදහස් කිරීම් සම්බන්ධ සියලු තොරතුරු හෙළිදරව් කරන මූල්‍ය විනිවිදභාවය සඳහා වූ තොරතුරු වේදිකාවක් පවත්වාගෙන යාම.
2. සෑම වසරකම මාර්තු 31 වනදා වන විට වාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කර, අනුමත අයවැයට සාපේක්ෂව පෙර වර්ෂයේ සිදු කළ වියදම් සහ වෙනස්කම් ඇත්නම් ඊට අදාල හේතු ඉදිරිපත් කිරීම.
3. යෝජිත ආදායම් ක්‍රමවේදවල යම් වෙනසක් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.1% ක හෝ ඊට ඉහල අඩු වීමක් සිදු විය හැකි නම් එම අහිමි වීම් වලට හේතු සඳහන් කරමින් ආදායම් වාර්තාවක් කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.
4. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන විගණන යෝජනා විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කිරීම.
5. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සුදුසු පරිදි සංශෝධනය කර, එහි සියලුම විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම, සහ එම විධිවිධාන පිළිනොපදින්නේ නම් දඬුවම් ලැබෙන බව සහතික කිරීම.
6. ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කටයුතු (අභිමත වියදම්) සඳහා වන අයවැය ප්‍රතිපාදන මුළු වියදමෙන් 3% දක්වා සීමා කිරීම.
7. විනිවිදභාවය සහ වගවීමේ ක්‍රමවේදයන් බලාත්මක කිරීම හරහා දේශපාලන නායකයින්ට සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ලබා දෙන ප්‍රතිලාභ වලට අදාළ දූෂණය හා නාස්තිය අවම කිරීම.
8. රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීමේ ගැටලුව ආමන්ත්‍රණය කිරීම.
9. සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සියලුම ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනුවලට අදාළ දත්ත, වෙළෙඳපොළෙන් පිටත විකිණීමේ සහ මිලදී ගැනීමේ අනුපාතයන් තක්සේරු කිරීමට ප්‍රමාණවත් විස්තර සහිතව (2019 දී ප්‍රකාශයට පත් කරන ලද EPF හි වෝහාරික විගණන මගින් විශ්ලේෂණය කළ පරිදි), ප්‍රකාශයට පත් කිරීම.
10. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ ප්‍රගාමී තොරතුරු හෙළි කිරීම යටතේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඒවා ආරම්භ කිරීමට මාස තුනකට පෙර හෙළිදරව් කිරීම.
11. රාජ්‍ය ණය පිළිබඳ යාවත්කාලීන කරන ලද සම්පූර්ණ තොරතුරු කාර්තුමය වශයෙන් ප්‍රකාශ කිරීම.
12. මුළු වටිනාකම රුපියල් මිලියන 100 ඉක්මවන සියලු රාජ්‍ය ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු පිළිබඳ තොරතුරු මාර්ගගත ක්‍රමයට ප්‍රකාශයට පත් කිරීම.
13. වත්කම් ප්‍රකාශන වලට මහජනතාවට ප්‍රවේශය ලබා දීම සඳහා දූෂණ විරෝධී පනතේ නීතිරාමුව අපක්ෂපාතීව ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
14. ව්‍යවස්ථානුකූලව නියම කර ඇති කාල රාමුවට අනුකූලව ජාතික මැතිවරණ පැවැත්වීම.
15. මැතිවරණ ප්‍රචාරක වියදම් හා සබැඳි නීති බලාත්මක කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් පිහිටුවීම.
16. විමර්ශන කිරීමට සහ නීතිය ඵලදායීව හා සමානව ක්‍රියාත්මක කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ඇති සූදානම ඉහළ නැංවීම.

17. විනිවිදභාවය සහතික කිරීම සඳහා සියලූ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යපෘති සඳහා වන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා සම්බන්ධ සියලූ ලේඛන මාර්ගගත ක්‍රමයට ප්‍රකාශයට පත් කිරීම.

18. ප්‍රජාතන්ත්‍රවාදීව විසම්මුතිය සහ විරෝධතා දැක්වීම ඇතුළුව රාජ්‍යකරණයට පුරවැසි සහභාගීත්වය සුදුසු ආකාරයෙන්ම ලබා දීම සඳහා සිවිල් අවකාශය ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම.

කෙටි කාලීනව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ (අවුරුද්දක් ඇතුලත)

## සාර්ව දේශපාලන - ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාරභාවය වැඩිදියුණු කිරීමේ පියවර

19. පුද්ගල අභිමතය පරිදි අනුමත ක්‍රමයෙන් බැහැරව බදු ක්‍රමය වෙනස් කිරීම වැළැක්වීම සඳහා බදු සම්බන්ධ සියලූ නීති සංශෝධනය කළයුතුය.

20. ශ්‍රී ලංකාවද පාර්ශවකරුවෙකු වන දුම්කොළ පාලනය පිළිබඳ සම්මුතියේ (6 වැනි වගන්තිය) අපේක්ෂා කරන පරිදි මිල සහ බදු ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළයුතුය.

21. බදු නිදහස් කිරීම් වල වසර පහක සාමාන්‍ය අගයෙන් 10% ක් වාර්ෂිකව කපා හැරීම (1 වන නිර්දේශය හා බැඳේ).

22. මහ බැංකුවට පරිබාහිරව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීම.

23. රාජ්‍ය ප්‍රසම්පාදන පිළිබඳ වඩා හොඳ අධීක්ෂණයක් සිදු කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව බලගැන්වීම, සහ 2019 වසරේ සකස් කළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මහජන අදහස් විමසන ලදුව සම්මත කිරීම.

24. තරඟකාරී ලංසු තැබීමේ අඩුම අනුපාතය (වටිනාකම) සහිත සහ වාර්ෂික ප්‍රසම්පාදන වල මුළු අගය රුපියල් බිලියන 10 ඉක්මවන රාජ්‍ය අමාත්‍යාංශ/නියෝජිත ආයතන 10ක් පිළිබඳ විශේෂ විගණන පැවැත්වීම.

25. බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ ලේඛනයක් ඕනෑම පුරවැසියකුට ප්‍රවේශ විය හැකි ලෙස මාර්ගගතව පවත්වා ගෙන යාම.

26. රාජ්‍ය ව්‍යවසායන් විනිවිද භාවයෙන් හා වගකීමෙන් යුතුව කළමණාකරණය කිරීම සඳහා රෙගුලාසි පැනවීම.

27. අඛණ්ඩතාව සහ වගවීම සඳහාත්, විශේෂයෙන් පාර්ලිමේන්තුව කල් තබන සෑම අවස්ථාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA), පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සහ රාජ්‍ය මුදල් කාරක සභාව (COPF) ආදියෙහි කටයුතු කඩාකප්පල් වීම වැළැක්වීම සඳහාත්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සංශෝධනය කිරීම.

28. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල හමුදාව යෙදවීම අඩු කිරීම, සේවයෙන් නිදහස් කිරීමට පෙර හමුදා සාමාජිකයින්ට වෙනත් පුහුණු වීම් ලබා දීම, සහ පුද්ගලික සහ පොදු භාවිතය සඳහා ඇති රජයේ ඉඩම් ආපසු ලබා දීම ආදී ක්‍රියා මගින් සන්නද්ධ හමුදා සඳහා වන අනවශ්‍ය වියදම් අඩු කර ගැනීම.

29. නව සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලට අදාළ මුදල් හුවමාරුවීම්වල විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම.

30. නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන් සම්බන්ධව නිසි අධීක්ෂණයක් පැවතීම සහ ඊට අදාළ නීතිය බලාත්මක කිරීම.

මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ (අවුරුදු 2 ඇතුලත)

## ව්‍යූහාත්මක වෙනස්කම් සඳහා වන පියවර

31. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට (UNCAC) අනුකූලව සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම පිළිබඳ නීති පුළුල් මහජන අදහස් විමසීමක් සහිතව සම්මත කර ගැනීම, සහ සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීමේ වැඩසටහනෙහි (Stolen Asset Recovery Initiative) තාක්ෂණික සහාය ඇතිව, දැනටමත් ආරම්භ කර ඇති පරීක්ෂණ ඇතුළුව, මූලික දූෂණ සිද්ධීන් පිළිබඳ ප්‍රධාන පරීක්ෂණවල ප්‍රගතිය සහතික කිරීම.

32. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික මගපෙන්වීම සහිතව විශේෂිත ස්වාධීන දූෂණ නඩු පැවරීමේ කාර්යාලයක් පිහිටුවීම.

33. මලයහ දෙමළ ප්‍රජාවට තමන්ගේම නිවාස තනා ගැනීමට එම ප්‍රදේශවල ඉඩම් වෙන් කර දීම, සහ වතුකරයේ කම්කරුවන්ට දෛනික ජීවන දීමනාවක් ලබා දීම (නිවාස හා ජීවනෝපාය පිළිබඳ අයිතිය).

34. සිවිල් නියෝජිතයින් බහුතරයක් වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය සහ ව්‍යූහය වෙනස් කිරීම.